# පුරාවෘත්ත පදනම් කරගත් දේශීය සංචරණය ශ්‍රී ලංකාව තුළ දියුණු කිරීමේ ඇති වැදගත්කම (නුවරඑළිය දිස්ත්‍රික්කයේ රාවණ පුරාවෘත්තය ඇසුරින්)

එම්. පී. ලක්මිණි ජයලත්*

---

මිනිසා ශිෂ්ටාචාරගත වීමටත් පෙර සිටම යම් යම් අරමුණු එනම් ආහාරපාන, ආරක්ෂාව, කුතුහලය මත සංචරණයේ නිරත වූ අතර මානව ශිෂ්ටාචාරගත වීමත් සමග කාලීනව පැවත එමින් ගවේෂණය, දේශපාලනය, විනෝදය මූලික කරගත් සංචරණය දක්වා සංචරණය ක්‍රමිකව විකාශනය වන්නට විය. මේ අනුව අද වන විට සංචරණය කර්මාන්තයක් දක්වා වර්ධනය වී ඇති අතරම සංචරණ ක්‍රියාවලියද, මිනිසාගේ සංචරණ අරමුණු ද කාලීනව වෙනස් වෙමින් පවතී. ඒ අනුව අද වන විට පරිසර හිතකාමී සංචරණය, ත්‍රාසජනක සංචරණය, ආදී සංකල්ප ඔස්සේ සංචරණයට නැඹුරු වීමක් දක්නට ලැබේ. මෙලෙස බිහි වූ සංකල්ප අතර අතීත වීරයන් හා බැඳි වීරත්වය මූලික කරගත් පුරාවෘත්තයන් පදනම් කොට ගනිමින් එම වීර චරිත හා බැඳුණු ස්ථාන නැරඹීමට යාම හෙවත් පුරාවෘත්ත සංචරණය (Legend Tourism) යන සංකල්පය ද ප්‍රචලිත වෙමින් පවතී.

මේ අනුව මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වූයේ නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ රාවණ පුරාවෘත්තය ප්‍රචලිතව පවතින ආකර්ෂණ ස්ථාන හඳුනා ගැනීම සහ එම ආකර්ෂණ වෙත දේශීය සංචාරකයා යොමු කිරීම වේ. එසේ ම දැනට අප සමාජයෙන් වියැකී යන්නා වූ ජනප්‍රවාදයන් ආරක්ෂා කර ගැනීමත් ඒවා අනාගත පරපුරට සම්ප්‍රේෂණය කිරීමත් මෙහි උප අරමුණු වේ. ඒ සඳහා ගුණාත්මක දත්ත මත පදනම්ව පර්යේෂණ ක්‍රමවේදය සකස් කෙරිණි. ප්‍රාථමික දත්තයන් වශයෙන් නුවරඑළිය දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ජනතාවගෙන් සම්මුඛ සාකච්ඡා ඔස්සේ රාවණා පුරාවෘත්තය පිළිබඳ තොරතුරු ද, සාහිත්‍ය මුලාශ්‍ර සහ අන්තර්ජාලය ඔස්සේ ද්විතීක දත්තයන් මගින් ද තොරතුරු රැස් කර ගන්නා ලදී.

අධ්‍යයනයෙන් අනාවරණය කරගත් තොරතුරු අනුව නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ රාවණ පුරාවෘත්තය හා බැඳි ප්‍රධාන සංචාරක ආකර්ෂණ මෙන්ම අතුරු ආකර්ෂණ රැසක් වේ. එසේම මෙම ආකර්ෂණ ස්ථාන වෙත නුවරඑළිය දිස්ත්‍රික්කයට පැමිණෙන සංචාරකයන් හට ඉතා අඩු කාලයකින් ළඟා විය හැකිය. එහෙත් මෙම ස්ථානයන් මෙතෙක් සංචාරක ආකර්ෂණයන් ලෙස ප්‍රවර්ධනය වීමක් හෝ සංචාරක පහසුකම් වැඩි දියුණු වීමක් හෝ සිදු වී නොමැත. මෙම ස්ථානයන් සංචාරකයන් උදෙසා ප්‍රවර්ධනය සහ පහසුකම් සැලසීම සිදු කිරීම මගින් නව සංචාරක ආකර්ෂණ කරා සංචාරකයා යොමු කිරීමටත්, පුරාවෘත්තයන් පදනම් කරගත් මෙවැනි ස්ථානයන් ආරක්ෂා කර ගැනීමටත් අවස්ථාව උදා වේ.

ප්‍රමුඛ පද - සංචරණය, රාවණ පුරාවෘත්තය, නුවරඑළිය, දේශීය සංචරණය, පුරාවෘත්ත

---

* පුරාවිද්‍යා අධ්‍යන අංශය, කැලණිය විශ්ව විද්‍යාලය mglakmini@gmail.com